**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**3 සතිය**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 6.2.2. රෆායල් සන්සියො ශිල්පියාගේ නිර්මාණ අගයමු |

## ඉගෙනුම් ආධාරක

### රෆායල් සන්සියො

- පුනර්ජීවන යුගයේ විසූ ශ්‍රේෂ්ට චිත්‍ර ශිල්පීන් අතර රෆායල් සන්සියෝ ශිල්පියාට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.
- මොහු වර්ෂ 1483 වර්ෂයේ දී උර්බිගෝ නැමති නගරයේ උපත ලැබුවේය.

### ඇතැන්ස් ගුරුකුලය

- ඇතැන්ස්හි ගුරුකුලය රෆායල් විසින් නිර්මාණය කරන ලද විශිෂ්ට බිතු සිතුවමක් වේ.
- මෙය රෝමයේ ස්ටැන්සා ඩෙලා සිගන්චුරා නැමැති ගොඩනැගිලි බිත්තියක ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද්දකි.
- වාස්තු විද්‍යාත්මක අවකාශය මත රූප සම්පිණ්ඩනය කිරීම පිළිබඳ දක්වා ඇති කුසලතාව සහ ප්‍රතිභාව නිර්මාණකරණයේ අග්‍ර ඵලයක් ලෙසට විචාරකයෝ හඳුන්වති.
- චිත්‍රයෙන් දැක්වෙන්නේ පැරණි ග්‍රීක දාර්ශනික ඇතන්ස් ගුරුකුලයයි.
- සිතුවම මධ්‍යයේ ඇරිස්ටෝටල් හා ප්ලේටෝ යන දාර්ශනිකයන් දක්වා ඇති අතර සෙසු දාර්ශනිකයන් වාද විවාදවල පැටලි සිටින අයුරු පෙන්නුම් කරයි.
- මෙම දාර්ශනික ලෝකය ක්‍රියාකාරී මානව රූප සම්පිණ්ඩනය මගින් ඉදිරිපත් කර තිබීම මෙම සිතුවමේ දැකිය හැකි විශේෂතාවකි.
- දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද, අඳුරු කහ වර්ණවල විවිධ ප්‍රභේද, රඹ සහ සුදු ආදී වර්ණයන්
- සිතුවම සඳහා භාවිත කර ඇත.

ඇතැන්ස් ගුරුකුලය (School of Athens)



මැඩෝනා ඩෙලා සේදියා (Madonna Della Sedia)



තණපිටියේ සිටින මැඩෝනා (Madonna of the Meadows)



ලබා දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1) රෆායල් සන්සියෝ ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2) රෆායල් සන්සියෝගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

3) පහත දී ඇති සිතුවම හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න



- හඳුනාගත් බව : ……………………………………………………
- ශිල්පියා : ……………………………………………………
- ශිල්ප ක්‍රමය : ……………………………………………………
- වර්ණ භාවිතය : ……………………………………………………
- ශිල්පීය කුසලතා : ……………………………………………………

**ඇගයීම**

1) රෆායල් සන්සියෝ ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්න.

2) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන වගු ගත කරන්න.

3) රෆායල් සන්සියෝ ශිල්පියාගේ ප්‍රධාන සිතුවම් 3ක් ගෙන හඳුනාලත් බව, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය හා ශිල්පීය කුසලතා යන උප මාතෘකා ඔස්සේ කෙටි හැඳින්වීමක් කරන්න